**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 15 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

**<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 493,260,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය තහවුරු කිරීමේ ලියකියවිලි සහ තක්සේරු වාර්තා විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | මැනුම් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම සහ තක්සේරු කරන ලද ඉඩම්වල වාර්තා ලැබී නොමැති බව දන්වමි. |

### 1.4 <u>අනුකූල නොවීම්</u>

**<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> | | | |
| 139 වගන්තිය | වරිපනම් බදු අයකළ හැකි සීමාව තුළ පිහිටි බදු අය නොවන සියළුම දේපල හඳුනාගෙන තක්සේරු කිරීමේ කාර්යය සඳහා වූ වාර වාර්තා ලබාගෙන නොතිබුණි. | තක්සේරු කිරීමේ කාර්යය සඳහා වූ වාර වාර්තා ලබාගත යුතුවේ. | මේ සඳහා අවශ්‍ය කටයුතු කර ඉදිරි කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීමට ආණ්ඩුකාරතුමා වෙත යවා ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මු.රෙ. 760 | 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් භාණ්ඩ විෂයයන් 56 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | ඌණ භාණ්ඩ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | අයිතම 30 ක් මේ වන විට සොයාගෙන ඇති බව දන්වමි. |
| (ඇ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | සභාව විසින් 2014 ,2015 සහ 2016 වර්ෂවලදී අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 107 ක් පරීක්ෂාකර අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි. | ඉදිකිරීම් භෞතිකව පරීක්ෂා කර ගැසට් පත්‍රයේ විධි විධාන අනුව තහවුරු කළ යුතුවේ. | ඉදිරියේදී අනුකූලතා සහතික ලබා ගැනීමට අනිවාර්ය කරනු ලබන බව දන්වමි. |

**2.** <u>මූල්‍ය සමාලෝචනය</u>

**2.1** <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,046,273 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,741,559 ක් විය.

**2.2** <u>ආදායම් පරිපාලනය</u>

**2.2.1** <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2019 ඇස්තමේන්තුගත ආදායම රු. | 2019 බිල් කළ ආදායම රු. | 2019 රැස්කළ ආදායම රු. | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | 2018 ඇස්තමේන්තුගත ආදායම රු. | 2018 බිල් කළ ආදායම රු. | 2018 රැස්කළ ආදායම රු. | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i)0 | වරිපනම් හා බදු | 1,021,000 | 1,021,000 | 975,156 | 45,844 | 790,000 | 948,957 | 846,484 | 102,473 |
| (ii) | කුලී | 6,961,680 | 6,961,680 | 6,494,102 | 467,578 | 13,099,200 | 3,690,051 | 2,899,037 | 791,014 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 862,000 | 640,143 | 640,143 | - | 666,200 | 621,280 | 621,280 | - |
| (iv) | වෙනත් ආදායම් | 7,471,570 | 7,471,570 | 6,686,360 | 785,210 | 2,784,000 | 4,446,579 | 3,279,446 | 1,167,133 |
| | **එකතුව** | 16,316,250 | 16,094,393 | 14,795,761 | 1,298,632 | 17,339,400 | 9,706,867 | 7,646,247 | 2,060,620 |

**2.2.2** වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | | නිර්දේශය<br>-------------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>----------------------- |
|---|---|---|---|---|
| (අ) | වරිපනම් බදු<br><br>(i) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 395,262 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු.99,233 ක් අයකර නොතිබුණු අතර, එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 25 ක් විය. | | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | රු.66,740 ක් මේ වන විට අයකරගෙන ඇති බව දන්වමි. |
| | (ii) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 281,030 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 200,442 ක් අයකර නොතිබුණි. එම අය නොකළ මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟ වරිපනම් මුදලින් සියයට 71 ක් විය. | | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | රු.66,740 ක් මේ වන විට අයකරගෙන ඇති බව දන්වමි. |
| (ආ) | බදු කුලී | | | |
| | 2011 වර්ෂයේ සිට 2018 දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් සභාවට අයත් දේපල 13 ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු. 417,556 ක් අයකර නොතිබුණි. | | හිඟ බදු මුදල් අයකර ගත යුතුවේ. | ලේඛන වැරදි ලෙස නඩත්තු කිරීම නිසා වැරදි හිඟ ශේෂයන් පවතින බවද, ඒවා ඉදිරියේදී නිවැරදි කරන බවද ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.3** කඩකාමර කුලී

| විගණන නිරීක්ෂණය<br>--------------------------- | නිර්දේශය<br>-------------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>-------------------- |
|---|---|---|
| බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට අයත් බස් නැවතුම්පොල දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩකාමර 13 කින් කඩකාමර 10 ක මාසික බදු කුලිය අයකිරීමේදී ඌව පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව කටයුතු කර නොතිබීම නිසා 2016 මැයි සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා රු. 479,600 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු වාර්තා අනුව කුලී අය කළ යුතුවේ. | 2021 වර්ෂයේ සිට නව තක්සේරුවක් සිදු කරන බැවින් එම නව තක්සේරුව අනුව කටයුතු කරන බව දන්වමි. |

**2.2.4** <u>වෙනත් ආදායම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් මාර්ගතලනය සහ ටිපර් රථය කුලියටදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.231,240 ක් අයකර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකරගත යුතුවේ. | රු.156,720 ක් අයකරගෙන ඇති බවද ඉතිරිය අයකර ගන්නා බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් අයවිය යුතු එකතුව රු. 154,035 ක හිඟ ජල ගාස්තු අයකර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකරගත යුතුවේ. | මේ වන විට රු. 39,670 ක් අයකරගෙන ඇති බවද ඉතිරිය අයකර ගන්නා බව දන්වමි. |

**2.2.5** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු හිඟ උසාවි දඩ රු.1,301,831 ක් හා හිඟ මුද්දර ගාස්තු රු. 3,035,916 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | මේ වන විට උසාවි දඩ රු. 778,839 ක් සහ මුද්දර ගාස්තු රු. 1,225,799 ක් අයකරගෙන ඇති බවද, ඉතිරි මුදල් අයකර ගන්නා බව දන්වමි. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් දිරන කසළ භාවිතා කර කාබනික පොහොර නිපදවීමට කටයුතුකර නොතිබුණි. | කාබනික පොහොර නිපදවීමට කටයුතු කළ යුතුවේ. | කාබනික පොහොර නිපදවීමට අවශ්‍ය කටයුතු කරමින් සිටින බව දන්වමි. |

(ආ) <u>තිරසර සංවර්ධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | මේ පිළිබඳව මූලික ඇගයීමක් සිදුකර ඇති බවද, ඉදිරි කටයුතු කරන බව දන්වමි. |

**3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් වාහන 3 ක් 2013 දෙසැම්බර් 03 දින වෙන්දේසි කිරීම සඳහා කහගොල්ල පළාත් යාන්ත්‍රික කාර්යාලයට ලබාදී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | කැබ් රථයේ අයිතිය පවරා ගැනීමට හා, වෙන්දේසිකර ඇති අත් ට්‍රැක්ටරයට අදාල මුදල් ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බවද, ජල බවුසරය වෙන්දේසි කිරීමට ලංසු කැඳවා ඇති බව දන්වමි. |
| (ආ) | <u>පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදීම</u> | | |
| | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම් 73 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදී නොතිබුණු බැවින් එක් බලපත්‍රයකට රු. 4,000 බැගින් රු. 292,000 ක ආදායමක් අහිමිවී තිබුණි. | මෙම ව්‍යාපාර පරීක්ෂා කර නියමිත ගාස්තු අයකර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතුවේ. | අදාල කර්මාන්ත හිමියන් දැනුවත්කර ඇති බව දන්වමි. |
| (ඇ) | සභාව භාවිතා කරන වාහන 4ක නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි. | නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය ලියවිලි පිළියෙල කර පවරා ගැනීම් සිදු කරන බව දන්වමි. |

**3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **කාර්ය මණ්ඩල පුරප්පාඩු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 5 කට අදාලව සේවක පුරප්පාඩු 8 ක් පැවතුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති බව දන්වමි. |

**3.4 <u>වත්කම් කළමනාකරණය</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාවට අයත් අක්කර 79 ක් වූ ඉඩම් කැබැලි 98 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉඩම් කැබලි 89 ක මැනුම් කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුවේ. | මේ සඳහා අවශ්‍ය ලිපි ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති ඇති බව දන්වමි. |
| (ආ) | රු.1,617,483 ක වියදමක් දරා බෝගහපැලැස්ස හන්දියේ ඉදිකර තිබුණු බෝගහපැලැස්ස කඩකාමර 2 ක් මාර්ග රක්ෂිතයේ ඉදිකර තිබුණු බැවින් එම ඉඩම පවරා ගැනීමට නොහැකිවී තිබුණි. | අදාල ආයතනය සමග සාකච්ඡා කර පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹ පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | පුස්සැල්ලාව ග්‍රාම නිලධාරී වසමේ වෙකුඹුරවත්ත ඉඩමෙන් අක්කර 15ක් කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන සඳහා යොදා ගැනීමට 2009 ජුනි 12 දින විශේෂ මහ සභා රැස්වීමේදී තීරණයකර 2010 දෙසැම්බර් 14 දින සභාවේ භුක්තියට පවරාගෙන තිබුණි. එමෙන්ම එම ඉඩමේ මැනුම් කටයුතු සඳහා 2010 වර්ෂයේදී රු. 120,000 ක්ද වැයකර තිබුණි. වර්ෂ 9 ක පමණ දීර්ඝ කාලයක් ගතවී ඇතත් අදාල වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණු අතර මෙම ඉඩමෙහි අනවසරයෙන් පවුල් 11 ක් පදිංචි වී තිබුණි. | කසල ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන ආරම්භ කළයුතු අතර අනවසර පවුල් ඉවත්කර ඉඩම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් සිටින බව දන්වමි. |
| (ඈ) | සභාවට අයත් පුස්තකාල 4 කින් 2007 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුල පාඨකයින්ට නිකුත්කර තිබුණු රු. 64,833 ක පිරිවැය වූ පුස්තකාල පොත් 541 ක් නැවත ලබාගෙන හෝ ඒ වෙනුවෙන් මුදල් අයකර හෝ නොතිබුණි. | පුස්තකාල පොත් නැවත ලබා ගැනීමට හෝ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විශාල පොත් ප්‍රමාණයක් ආපසු ලැබී ඇති බවද ඉතිරි පොත් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අවසන්වරට 2014 වර්ෂයේදී යාවත්කාලීන කර තිබුණු මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව මාර්ග 102 ක් පැවති අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය අනුව එම මාර්ග ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතුකර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කළ යුතුවේ. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර පසුව ගැසට් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**(ඊ)** <u>වාහන උපයෝජනය</u>

සභාවට අයත් ටිපර් රථය කිලෝමීටරයකට රු. 109 ක කුලී මුදලක් අයකර ගැනීමේ පදනම මත පෞද්ගලික ආයතනයකට ලබාදීමට 2018 නොවැම්බර් 15 දින පැවති මාසික සභා රැස්වීමේදී තීරණය කර 2018 දෙසැම්බර් 05 දින සිට 2019 ජුනි 03 දින දක්වා කුලී පදනම මත ලබාදී රු. 219,240 ක කුලී ආදායමක් රැස්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (i) ටිපර් රථය කුලී පදනම මත ලබාදීමේදී අදාල පෞද්ගලික ආයතනය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි . | සභාවට අයත් වාහන කුලී පදනමට ලබාදීමේදී ගිවිසුමකට එළඹිය යුතුවේ. | වාචික එකඟතාවයන් මත කුලියට දුන් බවද ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණු බව දන්වමි. |
| (i) කුලී පදනම මත ලබා තිබුණු ඉහත දැක්වෙන කාල පරිච්ඡේදයට අයත් 2018 දෙසැම්බර් 05 සිට 2019 පෙබරවාරි 24 දක්වා කාලය තුළ ටිපර් රථය කිලෝමීටර 6654 ක් ධාවනය කර තිබුණද, එම ගමන් සනාථ කිරීම සඳහා දෛනික ධාවන සටහන් පිළියෙල කර නොතිබුණි. | ධාවන සටහන් පිළියෙල කළ යුතු යුතුවේ. | රියදුරු විසින් ධාවන සටහන් අස්ථානගත කර ඇති බවද ඉන්ධන යෙදවීම් ලේඛනයක් පවත්වාගෙන ඇති බව දන්වමි. |

**4.** <u>**ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**</u>

**4.1** <u>**අභ්‍යන්තර විගණනය**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------- | ------------- | ------------------ |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර ඇති අතර ඉදිරියේදී අභ්‍යන්තර විගණනයක් සිදුකරන බව දන්වමි. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාව තුළ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරියේදී විගණන හා කළමනාකරණ කමිටු පවත්වන බව දන්වමි. |